මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන්ට අනුව, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගම වැනි තොරතුරු දැක්විය යුත්තේ එම පුවතට සෘජුවම අදාළ වන්නේ නම් පමණි. කෙසේ නමුත්, එම ආචාර ධර්මය මාධ්‍ය තුළ උල්ලංඝනය වන අවස්ථාවන් ද දක්නට ලැබේ.

ඊට උදාහරණයක් ලෙස, "ශිවන්‍යාට වශීවී දරුවන් නිවසින් පැන ගියේ ඇයි" යන සිරස්තලය සහිතව, දරුවන් රූපවාහිනී තරු වලට ආශක්ත වීමේ මනෝභාවයන් සම්බන්ධයෙන්, සති අග අරුණ පුවත්පතේ පළවූ විස්තරාත්මක ලිපියක් දැක්විය හැක.

එහිදී අනුරාධපුරයේ නිවසින් පැන ගිය දරුවන් තිදෙනා පිළිබඳ සඳහන් කෙරී තිබූ අතර, එම දැරියන්ගේ වාර්ගිකත්වයක් සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නොතිබුණි.

නමුත් ඉන් අනතුරුව පසුගිය වසරේ කොළඹ කෙසෙල්වත්තේදී නිවසින් අතුරුදන් වූ දරුවන් තිදෙනා පිළිබඳවද ලිපිය තුළ සඳහන් කෙරුණු අතර, එහිදී එම දරුවන් "මුස්ලිම් ජාතික" යැයි දක්වා තිබිණි.

1) එකම ලිපියක් තුළ එක් සිදුවීමකට අදාළ දරුවන්ගේ වාර්ගිකත්වය නොදැක්වෙන්නේත්, තවත් සිදුවීමකට අදාළ දරුවන්ගේ වාර්ගිකත්වය "මුස්ලිම්" යැයි දැක්වෙන්නේත් මන්ද?

2) මෙම ලිපියේ සන්දර්භයද සමගින් බැලූ විට, එසේ එක් සිදුවීමකට අදාළ දරුවන්ගේ වාර්ගිකත්වය පමණක් සඳහන් කිරීම පුවතට අදාළ යැයි ඔබ සිතන්නේ ද?

ඒ අනුව, මෙම ලිපිය හා එහි වාර්ගිකත්වය සඳහන් කිරීම සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?